www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව රාජ්‍ය තාන්ත්‍රික පොර පිටියක් බවට පත්වෙයි

## Sri Lanka becomes a diplomatic battleground

**2009 මැයි 25**

පසුගිය සති අන්තයට යෙදුනු එක්සත් ජාතීන්ගේ මහලේකම් බැන් කී මූන්ගේ ශ්‍රී ලංකා සංචාරය, දිග් ගැස්සුනු සිවිල් යුද්ධයෙන් පසුව උග්‍ර වූ ජාත්‍යන්තර එදිරිවාදිකම්වලට ඉමහත් අස්වැසිල්ලක් වී තිබේ.

එක්සත් ජනපද හා යුරෝපීය බලවතුන්ගේ ආස්ථානය පිලිබිඹු කරමින් බැන්, රටතුල අවතැන්ව සිටින 265,000 දෙමල වැසියන්, හමුදාව විසින් ගාල් කරනු ලැබ ඇති රැඳවුම් කඳවුරුවලට පිවිසීමේ වැඩි පහසුකම් ඉල්ලා සිටියේය. දෙමල සුලුතරයේ දුක්පීඩා වලට විසඳුම් සැපයීම මගින් 26 වසරක ගැටුමේ "තුවාල සුවකරන" ලෙස ද ඔහු කොලඹ ආන්ඩුවෙන් ඉල්ලීය.

යුරෝපීය සංගමය (ඊයූ) කොලඹ ආන්ඩුවට යෙදූ පීඩනය දැඩි කරමින් පසුගිය සතියේදී, දෙමල සිවිල් වැසියන් ඝාතනය පිලිබඳ යුද අපරාධ පරීක්ෂනයක් ඉල්ලා සිටියේය. පසුගිය 21 වන දින එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන්, රැඳවුම් කඳවුරු තුලට පිවිසීම සඳහා එක්සත් ජාතීන්ගේ ආයතනවලට ඉඩ සලසන ලෙස දැනුම්දීමට හා දෙමල සුලුතරය සමග ප්‍රතිසංධානගත වීම අවධාරනය කිරීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ දුරකථනයෙන් ඇමතුවාය.

රාජපක්ෂ හා ආන්ඩුව යුද අපරාධ පිලිබඳව නිසැකව ම වරදකරුවෝ වෙති. එල්ටීටීඊ යටතේ පැවති අවසාන බිම්කඩ වෙත හමුදාව ලඟාවෙද්දී ජනවාරි, මාසයේ සිට යුද කලාපය තුල අඩුම තරමින් 7,000 සිවිල් වැසියන් මිය ගිය බවට එක්සත් ජාතීන් ගනන් බලයි. එම ප්‍රදේශය හරහා ගුවන් ගමනේදී බැන්ට එක්වූ මාධ්‍යවෙදීන් ගත් ඡායාරූප වලින්, විනාශවූ ගොඩනැඟිලි, දැවී ගිය රථවාහන හා බෝම්බවලින් හැරුනු වලවල් සහිත ව්‍යසනයේ දර්ශන විදහා දැක්වුනි.

කෙසේ වුව ද එක්සත් ජනපදයෙන් හා යුරෝපයෙන් පලවන කනස්සල්ල, යුද්ධයට ගොදුරුවූවන් කෙරෙහි දැක්වෙන අව්‍යාජ අනුකම්පාවක් සමඟ ගැවිලාවත් නැත. පසුගිය තෙවසර පුරා මෙම බලවත්තු ම, රාජපක්ෂ යලි ඇරඹූ යුද්ධයට පිටුබලය දී ඇතුවාක් සේම, හමුදාව 2002 සටන් විරාමය අමු අමුවේ උල්ලංඝනය කිරීමේදීත් සිවිල් ඉලක්ක වෙත එහි බෝම්බ දැමීමේදීත් ආන්ඩු ගැති ඝාතක කල්ලිවල කටයුතු ද ඇතුලු ප්‍රජාතන්ත්‍රීය අයිතින් කඩකිරීමේදීත්, සිතාමතාම නිහඬ පිලිවෙතක් අනුගමනය කර තිබේ.

බ්‍රිතාන්‍යයේ හා ප්‍රන්සයේ මූලිකත්වයෙන් එක්සත් ජාතීන්ගේ මානව අයිතීන් පිලිබඳ කමිටු සාමාජිකයන් 17 ක්, ශ්‍රී ලංකාව ගැන සලකා බැලීමට මේ සතිය තුල විශේෂ සැසි වාරයක් සඳහා බලපෑම් කරනු ලැබිනි. සැබෑව නම් මෙම සාමාජිකයන්, ඉරාකය හෝ ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපදය විසින් කරන ලද යුද අපරාධ පිලිබඳව සාකච්ඡා කිරීමට විශේෂ සැසි වාරයක් කැඳවුම් කර නොතිබීමයි. එහිදී යුරෝපීය බලවත්තු, සිවිල් වැසියන් ඝාතනය හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අමු අමුවේ උල්ලංඝනය කිරීමෙහි ලා එක්කෝ නිහඬ පිලිවෙතක් අනුගමනය කරති, නැතහොත් ඒවාට කෙලින්ම වගකිව යුතුව ඇත.

එක්සත් ජනපදය හා යුරෝපීය බලවත්තු, යුද අපරාධ පරීක්ෂනය මෙන්ම, නැතුව ම බැරි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නය ප්‍රමාද කිරීමේ තර්ජනය, රාජපක්ෂ තන්ත්‍රය මත හුදෙක් එහි දේශපාලන බලපෑම් දැඩිකර ගැනීම පිනිස යොදාගනිමින් සිටිති. ප්‍රමුඛ අවධානය එදිරිවාදී බලවතුන්, සියල්ලටමත් ඉහලින් චීනය, කොලඹ තුල එහි තත්වය ශක්තිමත් කර ගැනීම සඳහා යුද්ධය වාසියට යොදාගෙන තිබීමේ කාරනය කෙරෙහි යොමුව පවතියි. බටහිර වාර්තාකරුවන් තරමක කෝපයෙන් සඳහන් කර ඇත්තේ, තමන්ට චීනයේ

සහයෝගය ඇතැයි යන දැඩි විශ්වාසය මත රාජපක්ෂට, සටන් විරාමයක් සඳහා එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යයේ ඉල්ලීමට කොකා පෙන්වීමට හැකි වී තිබෙන බවයි.

නිදසුනක් ලෙස, "ශ්‍රී ලංකාව නැගෙනහිර දෙසට පියවරක් ගනියි" යන සිරස්තලය සහිතව පසුගිය සතියේ *සිඩ්නි මෝර්නිං හෙරල්ඩ්* පුවත්පත මෙසේ ප්‍රශ්න කලේය. බටහිර බලපෑම් නොතකා හැරීමට රාජපක්ෂට හැකිවූයේ කෙසේ ද? "මකරාගේ (චීනයේ) මැදිහත්වීම හා අනෙකුත් නව මිතුරන්ගේ සැලකුම් හමුවේ ය. පසුගිය වසරේ ඩොලර් බිලියනයක් පමනවූ චීන ආධාර වලින් වැඩි කොටස, මහාමාර්ග, බලාගාර දෙකක් හා රාජපක්ෂගේ ගම් පලාත ද වන, දිවයිනේ දකුනු ප්‍රදේශයේ හම්බන්තොට, නව ජාත්‍යන්තර නාවික වරායක් ඉදිකිරීම වැනි පෙනෙන්නට ඇති විශාල ව්‍යාපෘතීන් සඳහා යොදවා තිබේ."

චීනය ශ්‍රී ලංකා හමුදාවේ ප්‍රධාන අවි සැපයුම්කරුවෙකු වන අතර, වාර්තාවී ඇති පරිදි ප්‍රහාරක ගුවන් යානා හයක් එරටට නොමිලයේ ලබා දී තිබේ. එයට හිලව් වශයෙන් චීනයට, හම්බන්තොට වරාය ඉදිකිරීමේ අයිතිය හිමිව තිබේ. එය මැද පෙරදිග හා අප්‍රිකාවේ සිට වැදගත් නාවික මාර්ග සුරක්ෂිත කර ගැනීමේ චීන මූලෝපායේ කොටසකි. එසේ ම දිවයිනේ වයඹ දිග වෙරල තීරයට ඔබ්බේ මුහුදු පතුලෙහි තෙල් ගවේෂන අයිතිය ද එයට හිමිවනු ඇත. පසුගිය සතියේදී කර්මාන්ත කරුවන්ගේ චීන නියෝජිත කන්ඩායමක්, සිය ආයෝජන සඳහා දිවයිනේ "වෙන්කල කලාපයක්" පිලිබඳව සාකච්ඡා කිරීමට එරටට ගමන් ගත්හ.

ඉහත පුවත්පත සඳහන් කලේ "ශ්‍රී ලංකාව යුරේසියා භූමි සමූහ කලාප සමාජයට එනම් දැනට රුසියාව, චීනය හා මධ්‍යම ආසියානු රටවල් පමනක් ඇතුලත්ව තිබෙන, ෂැන්හයි සහයෝගිතා සංවිධානයට (එස්සීඕ) සාදරයෙන් පිලිගෙන තිබෙන" බවයි. රුසියානු විදේශ ඇමති සර්ගේයි ලැව්රොව්ට අනුව මෙම වසර තුල ශ්‍රී ලංකාව හා බෙලෝ රුසියාව, එස්සීඕ හි ප්‍රථම සාකච්ඡා හවුල්කරුවන් බවට පත්වනු ඇත.

ශ්‍රී ලංකා දේශපාලන කරලිය තුල චීනයේ සහයෝගය විශේෂයෙන් ප්‍රයෝජනවත් වී තිබේ. ශ්‍රී ලංකාව පිලිබඳව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය තුල සාකච්ඡා හෝ ඊට බැඳුනු කුමන හෝ යෝජනාවක්, බීජිනය හා මොස්කෝව විසින් නැවත නැවතත් වලක්වා ලී ය. එක්සත් ජාතීන්ගේ මානව අයිතීන් පිලිබඳ කමිටුවේ විශේෂ සැසි වාරයක් පැවැත්වීමට පිලිතුරු වශයෙන්, චීනය හා රුසියාවේ මූලිකත්වයෙන් රටවල් 12 ක් "ත්‍රස්තවාදීන් කන්ඩායමකට" එරෙහි යුද්ධය ජයගැනීම වෙනුවෙන් කොලඹ පාලනය අගය කරමින් ප්‍රතිවිරුද්ධ යෝජනාවක් සභාගත කල අතර, ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර ආධාර සඳහා කැඳවුමක් ද නිකුත් කලේය.

දකුනු ඉන්දියාවේ දෙමල ජනතාව අතර පැතිරුනු කෝපය තුනී කිරීමට ඉන්දියාව, සටන් විරාමයකට පිටුබලය දුන් අතර ප්‍රතිවිරුද්ධ යෝජනාවට ද සිය නම ඇතුල් කිරීම සැලකිල්ලට ගැනීම වැදගත් ය. සිය ප්‍රතිවාදියා වන චීනය, කොලඹ තුල පතුරුවන බලපෑම පිලිබඳව සැබෑවටම උත්සුකව සිටින නව දිල්ලිය, දිගු කාලයක් තිස්සේ සිය බල වැයික්කියේ කොටසක් ලෙස පැවති දිවයින තුල, සිය තත්වය යලි ස්ථාපිත කර ගැනීමේ උත්සාහයක නිරතවෙයි.

චීනයේ පිටුබලය තීරනාත්මක වන්නේය යන්න ගැන කොලඹ රාජපක්ෂ තන්ත්‍රය බෙහෙවින්ම සැලකිලිමත්ව සිටියි. මෙම මස මුල දී රාජපක්ෂගේ සොහොයුරු ගෝඨාභය විසින් ප්‍රධානත්වය දරන ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව කෙරෙහි "බටහිර බලවතුන්ගේ කුහකත්වය හා උපාසක කම" හෙලා දකිමින් නිවේදනයක් නිකුත් කර තිබුනි. සිය විවේචනයේ ඉලක්කය නම්කර නොතිබුන ද, චීනය හා රුසියාව ද ඇතුලු අනෙකුත් රටවල්, "මුලු හදින් ම දුන් සහාය පිලිබඳව" කොලඹ ආන්ඩුව සිය කෘතඥතාව පලකරන බව එහි සඳහන් කර තිබුනි.

පසුගිය සතියේදී ජනාධිපති රාජපක්ෂ, ඔහුගේ සොහොයුරු ගෝඨාභය හා හමුදා ප්‍රධානියා, ඔවුන්ගේ ජයග්‍රාහී කථා හා ප්‍රකාශ තුල, චීනය ඉහලින්ම වර්නනා කලහ. ආන්ඩුවේ සහකරුවෙකු වන ජාතික හෙල උරුමයේ (ජේඑච්යූ) නායක අතුරලියේ රතන හිමි "අපගේ නියම මිතුරන් වන්නේ චීනය හා රුසියාව" බව සඳහන් කරමින් "ත්‍රස්තවාදීන් බේරාගැනීමට" වෑයම් කරන්නේ යයි බ්‍රිතාන්‍යයට හා එක්සත් ජනපදයට දැඩි ලෙස පහර ගැසී ය.

පසුගිය සතියේ දක්ෂිනාංශික අයිලන්ඩ් පත්‍රය ජයග්‍රාහී ලෙස ප්‍රකාශ කලේ, "මිනිසා සඳ මත පා තැබීම වැනි මනුෂ්‍ය වර්ගයාගේ නොසිතිය හැකි

දුර්ලභ වික්‍රමයන් ට, කුඩා ලංකාව ලත් ජයග්‍රහනය කිසි සේත්ම දෙවැනි නොවෙයි. ඇගේ යුද්ධය, බටහිර බලවතුන් සමග ඩේවිඩ් හා ගොලායත් තරගයක ඇඳුම් ආයිත්තම් බවට පත්ව තිබුනි. ශ්‍රී ලංකාවේ යුද්ධයේදී එක්සත් ජාතීන්ගේ සංගමය, එල්ටීටීඊය සාමාජික රාජ්‍යයක් ලෙස සලකා කටයුතු කලේ නම්, එවන් තත්වයක දී පවා ත්‍රස්තවාදය තලා දැමීමට ශ්‍රී ලංකාවට හැකි වීම ප්‍රාතිහාර්යයකි."

ශ්‍රී ලංකාවේ යුද්ධය, "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්" නොව දශක ගනනාවක දෙමල විරෝධී වෙනස්කම් කිරීම මඟින් නිර්මානය කල ලේ වැකි වාර්ගික ගැටුමක නිමැවුමක් විය. එසේ ම ජයග්‍රහනය ප්‍රාතිහාර්යයක් වූයේ ද නැත. ලොකු හා කුඩා සියලු බලවතුන් විසින් පිටුබලය දුන් ශ්‍රී ලංකාවේ මිලිටරිය, අවි බලයෙන් ද සංඛ්‍යාවෙන් ද එල්ටීටීඊ අභිබවා සිටි අතර, එය පවිත්‍රකරනයේ සිය යුද්ධය ගෙන ගියේ සිවිල් ජන ජීවිතය තුට්ටුවකට හෝ මායිම් නොකරමිනි.

පසුගිය සතියේ, ඉතිරිව සිටි එල්ටීටීඊ සටන්කරුවන් සමූලඝාතනය කිරීමෙන් පසුව ශ්‍රී ලංකාව, වෙනත් වර්ගයක ගැටුමක කේන්ද්‍රය බවට පත්ව තිබේ. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කමිටුව තුල විවෘත බෙදීම වනාහි, ලෝක ගෝලයේ සෑම කොනක දී ම සිය එදිරිවාදීන් පරයා ආර්ථික හා මූලෝපායික වාසි අත් කර ගැනීමට එකිනෙකා සමග තරක් කිරීම හමුවේ, පුලුල් ජාත්‍යන්තර ගැටුම් පිලිබඳ තර්ජනය ඉස්මතු කරමින් මහා බලවතුන් අතර බෙදීම් ගැඹුරු කරන වර්ධනයකි.

**පීටර් සිමන්ඩ්ස්**

©www.wsws.org